# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2140/30 – 2019 සැප්තැම්බර් 10 වැනි අඟහරුවාදා – 2019.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 175 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2016/HW/17.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/TUM/04/01/06/02.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 03 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, තුම්පනේ

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පළාත බටහිර කොට්ඨාසයේ, පුබ්බිලිය (321) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පුබ්බිලිය ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක Maha/TMP/2018/98 හා 2018.09.07 දිනැති ප්‍රගමන අනුරේඛණයේ හෙක්. 0.1257 යුත් පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – බැබිලේගෙදරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1257**
උතුරට: පී. ජී. නන්දාවතී හිමිකම් කියන බැබිලේගෙදරවත්ත; නැගෙනහිරට: ගලගෙදර සෝමරතන හිමි හිමිකම් කියන වැලිගොඩේවත්ත; දකුණට: ආර්. යූ. රූපේස්වර හිමිකම් කියන කලගහමුදුනේවත්ත සහ වැලි ගොඩේවත්ත; බටහිරට: ආර්. යූ. රූපේස්වර හිමිකම් කියන කලගහමුදුනේවත්ත සහ වැලි ගොඩේවත්ත සහ පී. ජී. නන්දාවතී හිමිකම් කියන බැබිලේගෙදරවත්ත.

09 - 805


1A – G 30947 – 26 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*